# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශේෂ

අංක 1867/1 – 2014 ජුනි මස 16 වැනි සඳුදා - 2014.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(3)(ආ) උප වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

2013 ජනවාරි මස 16 වැනි බදාදා, අංක 1793/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 03 වැනි ඡේදයේ සඳහන් කර ඇති, බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු අත්හිටුවීම සඳහා කරන ලද දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

02. 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(3)(ආ) උප වගන්තිය යටතේ ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වැලිමඩ ප්‍රාදේශීය සභාව 2014 ජුනි මස 16 වැනි දින සිට නැවත පිහිටුවනු ලැබේ.

03. එමෙන්ම, 2013 අගෝස්තු මස 07 වැනි බදාදා, අංක 1822/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය* මඟින් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යය ඉටු කිරීමට බදුල්ල දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් වන රත්නායක මුදියන්සේලාගේ ජයවර්ධන මහතාගේ පත් කිරීම 2014 ජුනි මස 16 වැනි දින සිට මෙයින් අවලංගු කරනු ලැබේ.

ශෂීන්ද්‍ර රාජපක්ෂ,
ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු,
ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල
පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය.

06-769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 2075— 10 (2014/06)

*සැ. යු.- අති විශේෂ ගැසට් අංක 1866/1 කාණ්ඩය අංක 1866/43න් අවසන් වේ.*

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*